ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව - පළමු වාරය,
ජීවන දැක්ම (සි) - 6 ශ්‍රේණිය
முயற்சியாண்மையும் நிதியியல் அறிவும் - முதலாம் தவணை
வாழ்க்கையின் தூரநோக்கு (சி) - தரம் 6

SC06EC1S-2026/327/246,900

# ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව

## පළමු වාරය
## ජීවන දැක්ම
## 6 ශ්‍රේණිය



වාණිජ දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා
ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති
අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ
අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ
අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද වීඩියෝ ඊ - තක්සලාව වෙබ් අඩවිය හා යූටියුබ් චැනලය මඟින් නැරඹිය හැකිය.
கல்வி வெளியீட்டுத் திணைக்களத்தினால் ஆக்கப்பட்ட வீடியோக்களை e- Thaksalawa இன் இணையத்தளம் மற்றும் youtube அலைவரிசைகளினூடாகப் பார்வையிட முடியும்.
Videos produced by the Educational Publications Department can be viewed via the website and the YouTube channel of e – thaksalawa.

e තක්සලාව™
The National e-Learning Portal for The General Education

https://www.e-thaksalawa.moe.gov.lk/

https://youtube.com/c/ethaksalawa-official

නැණස TV | நெனச TV

https://moe.gov.lk/students/nenasa-tv/

අන්තර්ක්‍රියාකාරී පාඩම්, වීඩියෝ පාඩම්, ශ්‍රව්‍ය ඉගෙනුම් ආධාරක, ක්‍රියාකාරකම් පත්‍රිකා, මාර්ගගත ප්‍රශ්නාවලි, පෙළපොත, අධ්‍යාපනික විනෝදාත්මක වැඩසටහන්, මාර්ගගත පාඨමාලා ඇතුළු තවත් අධ්‍යාපනික වැඩසටහන් සඳහා පිවිසෙන්න.
ஊடாடும் பாடங்கள், வீடியோப் பாடங்கள், செவிப்புல கற்றல் உதவிகள், செயலட்டைகள், நிகழ்நிலை வினாக்கள், பாடநூல்கள், கல்விசார் பொழுதுபோக்கு நிகழ்ச்சிகள், நிகழ்நிலை பாடநெறிகள் உட்பட மேலும் கல்விசார் நிகழ்ச்சிகளின் நிமித்தம் பிரவேசியுங்கள்.
Access for interactive lessons, video lessons, audio learning aids, activity sheets, online quizzes, textbooks, educational entertainment programs, online courses and more educational programs.

National Institute of Education
ChannelNIE
ජාතික අධ්‍යාපන ආයතනය
தேசிய கல்வி நிறுவகம்

වීඩියෝ වැඩසටහන්, පෙරහුරු ප්‍රශ්න පත්‍ර, ප්‍රායෝගික පරීක්ෂණ සහ සම්පත් පොත් යනාදී වටිනා අධ්‍යාපනික සම්පත් සඳහා පිවිසෙන්න
வீடியோ நிகழ்ச்சிகள், பயிற்சி வினாத்தாள்கள், செய்முறைச் சோதனைகள், வளநூல்கள் போன்ற பெறுமதியான கல்விவளங்களுக்காக பிரவேசியுங்கள்
Visit us for valuable educational resources; video programs, practice question papers, practical tests and resource books

අප රටේ දරු පරපුර වෙනුවෙන් රජයෙන් ඔබට ලැබුණු මේ මොඩියුලය ලබන වසරේදීත් ඔබ සහෝදර සහෝදරියනට ලබා දීමට හොඳින් පාවිච්චි කරන්න.

පාසලේ නම : ..............................................................................................

| | මොඩියුලය ලබාගත් ශිෂ්‍යයාගේ / ශිෂ්‍යාවගේ නම | ශ්‍රේණිය | පංති භාර ගුරුතුමාගේ/ ගුරුතුමියගේ අත්සන |
|---|---|---|---|
| 2026 | | | |
| 2027 | | | |
| 2028 | | | |
| 2029 | | | |

# ව්‍යවසායකත්වය
# හා
# මූල්‍ය සාක්ෂරතාව

පළමු වාරය

## ජීවන දැක්ම

## 6 ශ්‍රේණිය

වාණිජ දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
**ජාතික අධ්‍යාපන ආයතනය**
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

මුද්‍රණය හා බෙදා හැරීම
**අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව**

ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව
6 ශ්‍රේණිය
පළමු වාරය
මොඩියුලය 01 - ජීවන දැක්ම

ප්‍රථම මුද්‍රණය - 2025
© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN: 978-624-5729-93-7

වාණිජ දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය: www.nie.ac.lk

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
හොරණ, මිදෙල්ලමුලහේන, තල්ගහවිල පාර, අංක 65C හි පිහිටි
සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ (පුද්ගලික) සමාගමෙහි
මුද්‍රණය කරන ලදි.

Published by : National Institute of Education
Printed by : Karunaratne and Sons (Pvt) Limited
65C, Thalgahavila Road, Midellamulahena, Horana.

## ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පරිවර්තනීය ප්‍රතිසංස්කරණ ප්‍රයත්නය සෑම ඉගෙනුම්ලාභියකුගේ ම අවශ්‍යතා සපුරාලීම සඳහා තීරණාත්මක මාවතක් අරමුණු කර ඇත.

නිපුණතා පාදක ඉගෙනුම, විචාරාත්මක චින්තනය, නිර්මාණශීලීත්වය, 21වන සියවසේ කුසලතා, තාක්ෂණික නැඹුරුව, සදාචාරාත්මක පුරවැසිභාවය වැනි බොහෝ අංශ අවධාරණය කිරීමට හැකි වන පරිදි විෂය මාලාව, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම සහ තක්සේරු පිළිවෙත් යනාදිය නවීකරණය මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි පදනම විය.

අධ්‍යාපනඥයින්, අන්තර්වෙෂයික විද්වතුන්, ගුරුවරුන් සහ විවිධ පාර්ශ්වකරුවන් සමග සහයෝගී සංවාදයක් හරහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2026 වර්ෂයේ සිට 1 හා 6 ශ්‍රේණිවල ක්‍රියාත්මක කිරීමට යෝජිත විෂයමාලා හා අදාළ ඉගෙනුම් ද්‍රව්‍යවල ගුණාත්මක බව සහතික කිරීම සඳහා විශේෂ උනන්දුවක් ගෙන කටයුතු කළ ගරු අග්‍රාමාත්‍යතුමිය, අධ්‍යාපන ලේකම්තුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්, විෂය භාර නිලධාරීන්, විභාග කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය අති මහත් ය.

එමෙන්ම, මෙම කාර්යයේ දී සුවිශේෂ කැපවීමක් සිදු කළ ජාතික අධ්‍යාපන ආයතනයේ පාලක සභාවේ හා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ කැපවීම ද ගෞරව පූර්වක ස්තුතියෙන් සිහිපත් කරමි. මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීමට ඉමහත් ලෙස කැප වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සියලු කාර්ය මණ්ඩලයට ජාතියේ ගෞරවය හිමි විය යුතු බව සඳහන් කරමි.

**මහාචාර්ය මංජුලා විතානපතිරණ**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
2025.08.11

## අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

වර්තමානය වන විට ලෝකය ශීඝ්‍ර දියුණුවක් කරා පියනගමින් සිටින්නේ ය. ඒ හා සමගාමී ව පාසල් සිසු සිසුවියන්, නූතන ලෝකයේ අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය කුසලතාවලින් සන්නද්ධ කරවීම අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු සැමදෙනාගේම පරම වගකීමකි. ඒ අනුව යමින් 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක නව විෂයමාලාවට අදාළ මොඩියුල පාදක ඉගෙනුම් ක්‍රමවේදය මෙසේ හඳුන්වා දීමට අවස්ථාව ලැබීම සුවිශේෂ ජයග්‍රහණයක් බව මෙහිලා උදක්ම සඳහන් කළ යුතු ය.

සෑම විෂයක් සඳහා ම විශේෂයෙන් සකස් කර ඇති මෙම ඉගෙනුම් ආධාරක, විචාරශීලී චින්තනය මුවහත් කර ගනිමින් සංකීර්ණ ගැටලුවලට නිර්මාණාත්මක විසඳුම් සොයා ගැනීම, විවිධ කෝණවලින් කරුණු විශ්ලේෂණය කිරීම සහ තර්කානුකූල තීරණ ගැනීම ආදි කුසලතා ශක්තිමත් කර ගැනීම විෂයයෙහි මනා පිටිවහලක් වනු ඇතැයි විශ්වාස කරමි.

ගුණ නැණ සපිරි සිසු පරපුරකගේ සුබ සිහින සැබෑ කරන්නට මෙම ඉගෙනුම් ආධාරක ආලෝකයක් කර ගන්නා ලෙස ඔබ සැමගෙන් ඉල්ලා සිටිමි. මොඩියුල හා ක්‍රියාකාරකම් පොත් සම්පාදනය කිරීමේ විශිෂ්ට කාර්යය සඳහා අප්‍රමාණ දායකත්වයක් සැපයූ සියලු දෙනා වෙත මාගේ කෘතවේදී ස්තුතිය ප්‍රකාශ කරමි.

**ඩී. ඒ. සුභාෂිණී දෙමටගොඩ**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
2025.08.11

# පෙරවදන

සමස්ත පාසල් විෂයමාලාව සඳහා හඳුනගෙන ඇති පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර, නිරන්තරයෙන් වෙනස් වන රටක සහ ලෝකයක, තිරසර සංවර්ධනය කෙරෙහි වන අභියෝග ජය ගැනීමට එම ජාතියට ඇති හැකියාව පිළිබිඹු කරයි. එමෙන් ම කලින් කලට වෙනස් වන ඉල්ලුම්වලට ගැළපෙන සේ පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර ද හඳුනගෙන ඇත. එසේම පවතින පාසල් විෂයමාලාවෙහි විෂයන් නවීකරණය වන අතර ම නව විෂයන් පාසල් විෂයමාලාවට හඳුන්වා දීම සිදු කරයි. මෙම සිදු වන වෙනස්කම්වලට අනුරූප ව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ද කාලානුරූප ව සංවර්ධනය විය යුතු ය. ඒ අනුව 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නව විෂයමාලාවට අදාළ ව සැම විෂයක් සඳහා ම ඉගෙනුම පාදක ව මොඩියුල හඳුන්වා දී ඇත.

2026 වර්ෂයේ දී 1 සහ 6 ශ්‍රේණි සඳහාත්, 2027 වර්ෂයේ දී 2 සහ 7 ශ්‍රේණි සඳහාත්, 2028 වර්ෂයේ දී 3 සහ 8 ශ්‍රේණි සඳහාත්, 2029 වර්ෂයේ දී 4 සහ 9 ශ්‍රේණි සඳහාත්, 2030 වර්ෂයේ දී 5 ශ්‍රේණිය සඳහාත් ප්‍රාථමික අධ්‍යාපන ශ්‍රේණි සහ කනිෂ්ඨ ද්විතීයක ශ්‍රේණි සඳහා නව විෂයමාලා හඳුන්වා දීමට නියමිත ය. කනිෂ්ඨ ද්විතීයක අධ්‍යාපන අවධියේ සිට නව ඉගෙනුම් ක්‍රමවේද ඇතුළත් මොඩියුල සකස් කර ඇති අතර ඉගෙනුම්ලාභියාට අවශ්‍ය මගපෙන්වීම ගුරුවරයාගෙන් බලාපොරොත්තු වන අතර ස්වයං ඉගෙනුම සඳහා අවශ්‍ය පරිසරය මෙම මොඩියුලවලින් සලසා ඇත. ශිෂ්‍යයන්ට අවශ්‍ය සංකල්ප පිළිබඳ දැනුම මෙන් ම ලබා ගත් දැනුම භාවිත අවස්ථාවන්ට යොමු කර ශිෂ්‍ය හැකියා සංවර්ධනයට මෙම මොඩියුල බෙහෙවින් උපකාරී වන බව අපගේ විශ්වාසයයි. 21 වන සියවසේ කුසලතා වන සාක්ෂරතා, අන්තර්පුද්ගල හැකියා සහ අගයන් ආදිය මනා ලෙස ශක්තිමත් කිරීමට මෙම මොඩියුලවලින් ලැබෙන ඉගෙනුම ඉවහල් වනු ඇත.

නව තාක්ෂණය භාවිතයට අවශ්‍ය මග පෙන්වීම සැම මොඩියුලයක ම දක්වා ඇත. තව ද ශිෂ්‍යයන්ට තමා ළඟා කර ගත් කාර්ය සාධන සහ අධ්‍යාපන අරමුණු පිළිබඳ ව විනිවිදභාවයෙන් ඇගයීමට අවශ්‍ය තක්සේරු උපකරණ ලබා දෙනු ඇත. සැම විට ම නව හැකියා, දැනුම භාවිත අවස්ථාව සඳහා යොදවමින් යථාර්ථවාදී ඉගෙනුමකට අවශ්‍ය මග පෙන්වීම ලැබෙන ආකාරයෙන් මොඩියුල නිර්මාණය කර ඇත. විශේෂයෙන් ම මොඩියුල පාදක ඉගෙනුම් ක්‍රමවේද සකස් කිරීමට මූලික කටයුතු කළ අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරුන්ගේ හා ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ සේවාව ඉතා අගය කරමි. තව ද මෙම මොඩියුල සකස් කිරීමේ දී දායක වූ ආයතනයේ සියලු ම කාර්ය මණ්ඩලයට ද ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, අධ්‍යක්ෂවරුන් මෙන් ම රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ලබා දෙන ලද දායකත්වය මොඩියුල ගුණාත්මක ව ඉහළ මට්ටමකට සංවර්ධනය වීමට ඉවහල් වූ බව ඉතා සතුටින් සිහිපත් කරමි. මෙම මොඩියුල පරිහරණය කිරීමේ දී ඔබ ලබන අද්දැකීම් සහ යෝජනා අපහට ඉතාමත් වැදගත් වන බැවින් ඉදිරි මොඩියුල සංවර්ධනය කිරීමට ඔබගේ අදහස් හා යෝජනා අප වෙත ලබා දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

**කේ. රංජිත් පත්මසිරි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
විද්‍යා හා තාක්ෂණ පීඨය
2025.08.08

# උපදේශනය, රචනය හා සංස්කරණය

**උපදේශකත්වය** - මහාචාර්ය මංජුලා විතානපතිරණ,
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය

- කේ. රංජිත් පත්මසිරි මයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
විද්‍යා හා තාක්ෂණ පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය

**අධීක්ෂණය** - ආචාර්ය පී. එච්. කුසුමාවතී,
අධ්‍යක්ෂ, වාණිජ දෙපාර්තමේන්තුව/
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.),
අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය

**සම්බන්ධීකරණය** - සංජය රජීව් රත්නජීව මයා, කථිකාචාර්ය,
ජාතික අධ්‍යාපන ආයතනය

අයි. කයිලාසපති මයා, කථිකාචාර්ය,
ජාතික අධ්‍යාපන ආයතනය

**රචනය**
- ආචාර්ය පී. එච්. කුසුමාවතී
අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)
- ආනන්ද මද්දුමගේ මයා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
- ඩී. එල්. සී. ආර්. අජිත් කුමාර මයා, කථිකාචාර්ය
- සංජය රජීව් රත්නජීව මයා, කථිකාචාර්ය
- අයි. කයිලාසපති මයා, කථිකාචාර්ය
- කේ. කේ. අයි. කුමාරණතුංග මිය, කථිකාචාර්ය
- ආචාර්ය මංජුල රණසිංහ, කථිකාචාර්ය
- ඩබ්ලිව්. එම්. ඒ. බී. විජේසූරිය මයා, අධ්‍යක්ෂ (විශ්‍රාමික)

**සංස්කරණය (අභ්‍යන්තර)**
- ආචාර්ය පී. එච්. කුසුමාවතී,
අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)
- ආනන්ද මද්දුමගේ මයා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
- සංජය රජීව් රත්නජීව මයා, කථිකාචාර්ය
- අයි. කයිලාසපති මයා, කථිකාචාර්ය

**සංස්කරණය**
**(බාහිර)**

- මහාචාර්ය බී. නිශාන්ත,
  කොළඹ විශ්වවිද්‍යාලය
- මහාචාර්ය නලින් අබේසේකර,
  ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
- මහාචාර්ය එම්. වී. එස්. ශ්‍යාමන් උදයංග,
  ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- සිරිමා නානායක්කාර මිය, කථිකාචාර්ය (විශ්‍රාමික),
  ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය, මහරගම
- කමණී ගමගේ මෙනවිය, ශ්‍රී ලංකා විදුහල්පති සේවය
- එස්. එම්. ජී. ශ්‍යාමලී කුමාරිහාමි මිය, ශ්‍රී ලංකා ගුරු සේවය

**භාෂා සංස්කරණය**

- ජී. නයනා දීප්ති ගුණරත්න මිය,
  නියෝජ්‍ය අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්,
  අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- මද්දුමාගේ හසන්ති ප්‍රියදර්ශනී මිය, ශ්‍රී ලංකා ගුරු සේවය

**පිටු සැලසුම හා ග්‍රැෆික් නිර්මාණය**

- ජේ. එම්. චතුර මධුසංඛ මයා, මාධ්‍ය තාක්ෂණ ශිල්පී
  ජාතික අධ්‍යාපන ආයතනය

**චිත්‍ර නිර්මාණය**

- අමිතා ඉන්දිරාණී මිය, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
  කැලණිය කලාප අධ්‍යාපන කාර්යාලය

# හැඳින්වීම

ව්‍යාවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව විෂය ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියට වර්ෂ 2026 දී අලුතෙන් ම හඳුන්වා දෙන විෂයයක් වේ. මෙම විෂයය 6 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා ක්‍රියාත්මක වීමට නියමිත ය.

සමාජයේ යහපත් පුරවැසියෙකු ලෙස සාර්ථක ජීවිතයක් ගොඩනගා ගැනීම සඳහා අවශ්‍ය කෙරෙන නවෝත්පාදනය සහ නිර්මාණශීලිත්වය, අවදානම් බාර ගැනීම, අවස්ථා හඳුනා ගැනීම මෙන් ම පුද්ගලයකු සතු මූලික නිපුණතා (core competent) ගණනාවක් ව්‍යවසායකත්වය ඉගෙනීමෙන් ශිෂ්‍යයකුට අත්පත් කර ගැනීමට පුළුවන. එමෙන්ම මූල්‍ය සාක්ෂරතාව මගින් මුදල් ඇතුළු මූල්‍ය වත්කම් ඵලදායී ව පරිහරණය කිරීම සඳහා අවශ්‍ය කෙරෙන මූලික කුසලතා ගණනාවක් ද අත්පත් කර ගත හැකි ය.

ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව විෂයය යටතේ 6 ශ්‍රේණියේ දී වාර තුන සඳහා මොඩියුල 3ක් හැදෑරීමට සිදු වනු ඇත. මෙම මොඩියුලය 6 ශ්‍රේණිය පළමු වාරය සඳහා වන අතර, එය ක්‍රියාකාරකම් තුනකින් සමන්විත වේ. මෙම එක් එක් ක්‍රියාකාරකම් මගින් සිසුන් සතු හැකියාවන් හා කුසලතා හඳුනා ගැනීමටත්, ඔවුන්ගේ අනාගත බලාපොරොත්තුව පිළිබඳ නිර්මාණශීලීව අදහසක් ගොඩනගා ගැනීමටත්, එම අදහස සැබෑ කර ගැනීම සඳහා ක්‍රියාත්මක විය යුතු ආකාරය ගැන සිතා බැලීමටත් හැකි වනු ඇත. සමස්තයක් ලෙස ගත් කළ මෙම මොඩියුලය හැදෑරීම සිසුන්ට තම පරිකල්පන චින්තනය (imagination thinking) අවදි කර ගැනීමට රුකුලක් වනු ඇත. එමෙන්ම මොඩියුලය රචනා කිරීමේ දී 6 ශ්‍රේණියේ සිසුන්ගේ වයස් මට්ටම සලකා බලා අදාළ විෂය කරුණු ඉදිරිපත් කොට තිබේ.

ශීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් අපේක්ෂාවෙන් කටයුතු කරන අප රට ව්‍යාපාරික අංශයට ප්‍රමුඛතාවක් දී ඇති අවස්ථාවක, මෙම විෂය සාමාන්‍ය අධ්‍යාපන පද්ධතියට හඳුන්වා දීම කාලෝචිත තීරණයක් ලෙස අගය කළ හැකි ය.

ආචාර්ය පී. එච්. කුසුමාවතී
අධ්‍යක්ෂ, වාණිජ දෙපාර්තමේන්තුව,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.),
අධ්‍යාපන නායකත්ව සංවර්ධන සහ කළමනාකරණ පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය

## පටුන

**ක්‍රියාකාරකම 01** - ස්වයං කුසලතා හා දුර්වලතා අනාවරණය ..................................... 01

**ක්‍රියාකාරකම 02** - සිහින දකිමු, සැබෑ කර ගනිමු ...................................................... 07

**ක්‍රියාකාරකම 03** - ගැටලු හඳුනා ගෙන විසඳමු ......................................................... 18

## මොඩියුලයේ අපේක්ෂිත අරමුණු

මෙම මොඩියුලය සාර්ථක ව අධ්‍යයනය කිරීමෙන් පසු ඔබට පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගත හැකි වේ.

- ස්වකීය කුසලතා, දුර්වලතා, කැමති අකැමති දෑ සහ අවස්ථා අනාවරණය කර ගැනීම
- ස්වකීය අනාගත සිහිනය ගොඩනගා ගැනීම සඳහා පදනමක් සකසා ගැනීම
- ගැටලු සඳහා විසඳුම් යෝජනා කිරීම

ක්‍රියාකාරකම

01

# ස්වයං කුසලතා හා දුර්වලතා අනාවරණය




**මෙම ක්‍රියාකාරකමෙහි නිරත වීමෙන් ඔබට,**

- ස්වකීය කුසලතා හා දුර්වලතා අනාවරණය කර ගැනීමට
- තමා කිරීමට කැමති දෑ හා කිරීමට අකැමති දෑ පෙන්වා දීමට
- ස්වකීය කුසලතා, දුර්වලතා, කැමති, අකැමති දෑ සහ අවස්ථා සිතා බලා තමාට අනාගතයේ නිරතවිය හැකි ක්ෂේත්‍ර ප්‍රමුඛතාව අනුව පෙළගැස්වීමට

**හැකි වේ.**

# ක්‍රියාකාරකම 1

## ස්වකීය කුසලතා හා දුර්වලතා හඳුනා ගනිමු



### පියවර 1.1

පහත දැක්වෙන්නේ පුද්ගලයන් තුළ දක්නට ලැබෙන කුසලතා හා දුර්වලතා කිහිපයකි. මෙම කුසලතා හා දුර්වලතා කෙරෙහි හොඳින් අවධානය යොමු කරන්න.

**කුසලතා** (Skills)

- නොපැකිල ව ඉදිරිපත් වීම
- පරිසරය පිරිසිදු ව තබා ගැනීම
- පුද්ගලයන් සමග සහයෝගයෙන් වැඩ කිරීම
- ගැටලු මැනවින් හඳුනා ගැනීම
- වෙලාවට වැඩ කිරීම
- ඩිජිටල් තාක්ෂණය භාවිත කිරීම
- පිහිනීම
- ආචාරශීලී වීම
- කැප වී කටයුතු කිරීම
- පවුලේ කටයුතුවලට උදවු කිරීම

**දුර්වලතා** (Weaknesses)

- ආවේගශීලී වීම
- අරමුණු සහගත නොවීම
- අන් අයගේ මතවලට සවන් නොදීම
- ජයග්‍රහණය පමණක් අපේක්ෂා කිරීම
- අන් අය මත යැපීමට උත්සාහ කිරීම
- මව්බස හැර වෙනත් භාෂාවක් නොදැනීම
- තමුන් ගැන පමණක් සිතා කටයුතු කිරීම

ඉහත රූප සටහනෙහි දැක්වෙන කුසලතා හා දුර්වලතා ඊළඟ කාර්යයෙහි නිරත වීම සඳහා ඔබට ප්‍රයෝජනවත් වේ.

- **A** මෙහි දක්වා ඇති කුසලතා සහ දුර්වලතා කෙරෙහි නැවත අවධානය යොමු කරන්න.
- **B** ඒවායෙන් ඇතැම් කුසලතා හා දුර්වලතා ඔබ තුළ ද පැවතිය හැකි ය. ඒවා වෙන වෙන ම සටහන් කරන්න.
- **C** එම සටහන් කර ගත් කුසලතා හා දුර්වලතා හැර වෙනත් කුසලතා හා දුර්වලතා ඔබ තුළ පවතී නම් ඒවා ද වෙන වෙන ම සටහන් කරන්න.

ඔබ සතු කුසලතා හා දුර්වලතා නිර්මාණශීලී ආකාරයකට පිළියෙල කර ගුරුවරයාට ඉදිරිපත් කර අදහස් ලබා ගන්න.

**පියවර 1.1 යටතේ ඔබ කළ කාර්යයේ සාර්ථකත්වයේ ප්‍රමාණය මැනිය හැකි අයුරු දැක්වෙන වගුව**

| නිර්ණායක | කාර්ය සාධනය මැනෙන කුසලතා මට්ටම් | | | ලැබූ ලකුණු |
|---|---|---|---|---|
| | ඉතා හොඳයි (ලකුණු 10-08) | හොඳයි (ලකුණු 07-04) | සංවර්ධනය විය යුතුයි (ලකුණු 03-01) | |
| 1. අනාවරණය කර ගත් ස්වකීය කුසලතා හා දුර්වලතා ඉදිරිපත් කරයි. | නිර්මාණාත්මක අයුරින් ඉදිරිපත් කිරීම (කුසලතා හා දුර්වලතා 8ක් වත් ඇතුළත් වීම අවශ්‍යයි) | වගුවක් ඇසුරින් හෝ ලැයිස්තුවක් ඇසුරින් ඉදිරිපත් කිරීම (කුසලතා හා දුර්වලතා 8ක් වත් ඇතුළත් වීම අවශ්‍යයි) | කුසලතා හා දුර්වලතා දක්වා ඇතත් අසම්පූර්ණ වීම හා දුර්වල තත්ත්වයක පැවතීම | ---<br>10 |
| 2. සාමාන්‍ය ජීවිතයට ප්‍රයෝජනවත් වන කුසලතා ආදර්ශනය කරයි. | උනන්දුව, කැපවීම, කාල කළමනාකරණය, සැලකිලිමත් ව වැඩ කිරීම ආදී කරුණු 3ක් වත් ඉහළ මට්ටමකින් නිරීක්ෂණය වීම | උනන්දුව, කැපවීම, කාල කළමනාකරණය, සැලකිලිමත් ව වැඩ කිරීම ආදී කරුණු සතුටුදායක තත්ත්වයක පෙනෙන්නට තිබීම | උනන්දුව, කැපවීම, කාල කළමනාකරණය, සැලකිලිමත් ව වැඩ කිරීම ආදී කරුණු සාමාන්‍ය මට්ටමක පැවතීම | ---<br>10 |
| මුළු ලකුණු | | | | ---<br>20 |

ඔබ හිමි කර ගත් සමස්ත ලකුණු මත ඔබගේ සාර්ථකත්වයේ ප්‍රමාණය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි ආකාරය මෙසේ ය.

| ලකුණු | 15 - 20 | 09 - 14 | 8 හෝ ඊට අඩු |
|---|---|---|---|
| ඔබගේ සාර්ථකත්වය | විශිෂ්ටයි | මධ්‍යස්ථයි | සංවර්ධනය විය යුතුයි |



## පියවර 1.2

පියවර 1.1 යටතේ කරන ලද කාර්යය කෙරෙහි නැවත අවධානය යොමු කරන්න. එමගින් ඔබ සතු ව පවත්නා කුසලතා හා දුර්වලතා අනාවරණය කර ගැනීමට හැකි විය. මේ හැර පුද්ගලයන් තුළ ඔවුන් කිරීමට කැමති දෑ මෙන් ම අකැමති දෑ ද වේ. පුද්ගලයන් ස්වකීය අනාගත අපේක්ෂා ඇති කර ගැනීමේ දී තම කුසලතා හා දුර්වලතා ගැන පමණක් නොව තමා කිරීමට කැමති හා තමා කිරීමට අකැමති දෑ ගැන ද සලකා බැලීම වැදගත් වේ.

ඔබ කිරීමට වඩාත් කැමති හා ඔබ කිරීමට වඩාත් අකැමති දෑ පෙන්නුම් කරන පරිදි, පහත දැක්වෙන ආකාරයේ වගුවක් අභ්‍යාස පොතේ පිටපත් කර ගෙන එය සම්පූර්ණ කරන්න. (කරුණු 3ක් බැගින් ලිවීම සෑහේ.) ඔබේ අනාවරණ ගුරුවරයාට ඉදිරිපත් කරන්න.




| මම කිරීමට වඩාත් කැමති දේවල් | මම කිරීමට වඩාත් අකැමති දේවල් |
|---|---|
| 1. | 1. |
| 2. | 2. |
| 3. | 3. |

## පියවර 1.3

සමාජයේ ජීවත් වන විවිධ පුද්ගලයෝ විවිධ ක්ෂේත්‍රවල නිරත වී සිටිති. ඔබගේ දෙමව්පියන්, වැඩිහිටියන්, ඥාතීන් ආදීන් ගැන සිතා බලන්න. (නිදසුන්:-ව්‍යාපාරික, කෘෂිකාර්මික, අධ්‍යාපන, ක්‍රීඩා, වඩු කාර්මික සහ මෘදුකාංග ඉංජිනේරු ආදි ක්ෂේත්‍ර.) මෙසේ විවිධ ක්ෂේත්‍රවල නිරත වී සිටින අය අතුරෙන් ඇතැමෙකු එම ක්ෂේත්‍රවල සාර්ථක වන අතර, ඇතැම් අය එම ක්ෂේත්‍රවල එතරම් සාර්ථක බවක් නොපෙන්වති.



පුද්ගලයන් නිරත වන ක්ෂේත්‍රවල සාර්ථක වීම හෝ අසාර්ථක වීම කෙරෙහි ඔවුන්ගේ කුසලතා සහ දුර්වලතා ද, ඔවුන් කිරීමට කැමැති හා අකැමැති දෑ ද බලපානු ලැබේ.

ඔබ මේ වනවිට ඔබගේ කුසලතා හා දුර්වලතා පිළිබඳ ව ද ඔබ කිරීමට කැමති හා කිරීමට අකැමති දෑ පිළිබඳ ව ද අවබෝධයක් ලබාගෙන තිබේ. ඔබත් අනාගතයේ නිරත වීමට අපේක්ෂා කරන යම් යම් ක්ෂේත්‍ර තිබිය හැකි ය. ඒ අනුව ඔබ අනාගතයේ නිරතවීමට අපේක්ෂා කරන ක්ෂේත්‍ර කිහිපයක් සිතා බලා පහත සඳහන් උපදෙස් පිළිපදිමින් අදාළ තොරතුරු ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**උපදෙස්:**

**A** අනාගතයේ නිරත වීමට අපේක්ෂා කරන ක්ෂේත්‍ර සිතා බලන්න.

**B** එහි දී ඔබගේ කුසලතා, දුර්වලතා හා ඔබ කිරීමට කැමති හා අකැමති දෑ කෙරෙහි ද ඔබට බාහිර වශයෙන් ලබාගත හැකි උදවු උපකාර ගැන ද සිතා බලන්න.

**C** අනතුරුව එම ක්ෂේත්‍ර අතරෙන් ඔබට වඩාත් සාර්ථකව නිරත විය හැකි ක්ෂේත්‍ර 3ක් ප්‍රමුඛතාව අනුව පෙළ ගස්වන්න.

**D** ඔබ අනාගතයේ නිරත වීමට අපේක්ෂා කරන ක්ෂේත්‍ර 3 පිළිබඳ ව පහත දැක්වෙන ආකාරයේ වගුවක් අභ්‍යාස පොතේ පිටපත් කරගෙන තොරතුරු ඉදිරිපත් කරන්න.

| මම අනාගතයේ නිරත වීමට අපේක්ෂා කරන ක්ෂේත්‍ර | | |
|---|---|---|
| නිරතවීමට අපේක්ෂිත ක්ෂේත්‍ර (ප්‍රමුඛතාව අනුව) | තෝරා ගැනීමට හේතු | ඒ සඳහා මට පවතින වාසි සහගත උදවු උපකාර ආදිය<br>නිදසුන: පවුලේ සහයෝගය |
| 1. | | |
| 2. | | |
| 3. | | |

ඔබ කළ කාර්ය ගුරුවරයාට ඉදිරිපත් කර ඇගයීමක් ලබා ගන්න.

ක්‍රියාකාරකම

# 02

# සිහින දකිමු, සැබෑ කර ගනිමු.



**මෙම ක්‍රියාකාරකමෙහි නිරත වීමෙන් ඔබට,**

- ස්වකීය සිහිනය අදහසක් ලෙස ප්‍රකාශ කිරීමට
- ලොව ප්‍රසිද්ධියට පත් ව්‍යවසායකයින්ගේ චරිත ගවේෂණය කිරීමට
- සාර්ථකත්වයට පත් වූ පුද්ගලයන්ගේ පැවති සිහින පරීක්ෂා කිරීමට
- ස්වකීය සිහිනය සැබෑ කර ගැනීමෙන් තමන්ට, තම පවුලට හා රටට අත්වන ප්‍රයෝජන අනාවරණය කිරීමට


**හැකි වේ.**

# ක්‍රියාකාරකම 2


**සිහින දකිමු, සැබෑ කර ගනිමු.**



**පහත සඳහන් පෙළ කියවන්න.**



පක්ෂීන්ගේ පියාසර කිරීම නිරීක්ෂණය කළ 'රයිට්' සහෝදරයන්ගේ 'සිහිනය' බවට පත් වූයේ අහසේ පියාසර කරවීමට හැකි යානයක් නිර්මාණය කිරීම ය. 'යකඩ අහසේ පා කළ නොහැකි බව' එකල විද්‍යාඥයන්ගේ මතය විය. එහෙත් එම මතය අභියෝගයට ලක් කරමින් රයිට් සහෝදරයෝ ගුවන් යානයක් නිර්මාණය කර ඔවුන්ගේ සිහිනය සැබෑවක් කර ගන්නට සමත් වූහ. ලොව බොහෝ නව නිපැයුම්කරුවන්ගේ නිමැවුම් පළමුව ඔවුන්ගේ මනස තුළ සිහින ලෙස ජනිත වූ අදහස් ය.



ලෝක ප්‍රකට 'මෙන්ලෝ උද්‍යානයේ නිමැවුම්කරුවා' ලෙස විරුදාවලි ලත් තෝමස් අල්වා එඩිසන් එබඳු අයෙකි. ලෝකය වෙනත් දිශානතියකට යොමු කිරීමට පාදක වූ විදුලි බුබුළ, කැමරාව, ජල පොම්පය වැනි නව නිපැයුම් දහසකට වැඩි ගණනක් ඔහු දුටු සහ සැබෑ කර ගත් සිහින වේ.

මෙබඳු සිහින, පුද්ගලයන් නින්දේ දී දකින ඒවා නොව අවදියෙන් සිටිය දී ඇති කර ගන්නා සිතුවිලි හෝ අදහස් ය.

පුද්ගලයන් අවදිව සිටිය දී දකින සිහින පසු කලක දී ප්‍රයෝජනවත් අදහස් බවට පරිවර්තනය කර ගෙන ඒවා ක්‍රියාවන් බවට ද පත් කර ගත හැකි ය.

## Dream transform into thought and thought result in action.

**සිහිනය** Dream → **සිතුවිල්ල / අදහස** Thought → **ක්‍රියාවට පරිවර්තනය** Action




### පියවර 2.1

ප්‍රසිද්ධියට පත් ව්‍යවසායකයින් කිහිප දෙනෙකු සිහිපත් කර ගනිමු. ඒ. ටී. ආරියරත්න, වික්ටර් හෙට්ටිගොඩ, අචලා සමරදිවාකර, ඊලෝන් මස්ක්, ස්ටීව් ජොබ්ස්, මාක් සකර්බර්ග්, ජැක්මා, සුචිරෝ හොන්ඩා, රතන් ටාටා, බිල් ගේට්ස් වැන්නවුන් ගැන හා ඔවුන්ගේ ව්‍යාපාර ගැන ඔබ අසා තිබෙන්නට පුළුවන. ඔවුන් ස්වකීය සිහින සැබෑ කර ගත් ව්‍යවසායකයින් ලෙස හඳුනා ගැනීමට හැකි ය. එවැනි අය කිහිප දෙනෙකු පිළිබඳ ව '**ලෝක ප්‍රකට ව්‍යවසායකයින්**' තේමාව යටතේ පහත දක්වා ඇත.



- දැන් ඔබගේ ගුරුවරයාගේ උපදෙස් හා මග පෙන්වීම අනුව කණ්ඩායම් වී ක්‍රියාකාරකමක නිරත වීමට සූදානම් වන්න.
- ගුරුවරයාගේ මග පෙන්වීම අනුව ලෝක ප්‍රකට ව්‍යවසායකයින් අතරෙන් දෙදෙනෙකු තෝරා ගන්න.
- එම ව්‍යවසායකයින් දෙදෙනා ගැන හොඳින් කියවන්න. එහි දී ඔවුන්ගේ ව්‍යාපාර කාර්යන්, කළ කී දෑ ඔවුන්ගෙන් ඉගෙන ගත හැකි පාඩම්, ඔවුන්ගේ විශේෂතා පිළිබඳ ව අවධානය යොමු කරන්න.
- අනතුරුව ගුරුවරයා දැනුම් දුන් විට ඔබ තෝරා ගත් ව්‍යවසායකයින් දෙදෙනා පිළිබඳ තොරතුරු පන්තියේ සෙසු සිසුන්ට පවසන්න.
- ඉහත කාර්ය නිම කිරීමෙන් අනතුරුව පහත සඳහන් කාර්යයේ නිරත වීමට සූදානම් වන්න. එහි දී ගුරුවරයාගේ මග පෙන්වීම අනුව නැවත කණ්ඩායම් වන්න.
- සමාජයට ප්‍රයෝජනවත් කාර්යයක් කරන හෝ කළ ප්‍රාදේශීය හෝ ජාතික වශයෙන් කීර්තියට පත් පුද්ගලයන් ඇත. එවැනි පිරිමි හෝ කාන්තා චරිතයක් කණ්ඩායම් සාකච්ඡාවක් මගින් හඳුනා ගන්න.
- එසේ හඳුනා ගත් පුද්ගලයාගේ සිහිනය කුමක් විය හැකි දැයි සිතා බලා කණ්ඩායම තුළ සාකච්ඡා කර නිගමනයකට පැමිණෙන්න.
- කණ්ඩායම අනාවරණය කර ගත් තොරතුරු ගොනු කර පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න. ඒ සඳහා පහත දැක්වෙන ආකාරයේ වගුවක් ප්‍රයෝජනයට ගත හැකි ය.

| කණ්ඩායම විසින් හඳුනා ගත් පුද්ගලයාගේ නම | හඳුනා ගත් පුද්ගලයාගේ ව්‍යාපාර හෝ සමාජයීය කාර්ය | ඔබ සිතන පරිදි එම පුද්ගලයාගේ 'සිහිනය' |
|---|---|---|
| | | |



# ලෝක ප්‍රකට ව්‍යවසායකයින්



## ඒ.ටී. ආරියරත්න

මොහු ශ්‍රී ලංකාවේ ගාන්ධි වශයෙන් ද හඳුන්වයි. 'සර්වෝදය' ව්‍යාපාරය ගොඩනගා ග්‍රාමීය දුප්පත් බව හා නූගත්බව පිටුදැකීම, සාමය ගොඩනැගීම වෙනුවෙන් ඉමහත් සේවයක් කළ ව්‍යවසායකයෙකු වේ. මොහු සමාජය වෙනුවෙන් සේවයක් කළ ව්‍යවසායකයකු නිසා සමාජීය ව්‍යවසායකයකු ලෙස හඳුන්වයි. පුද්ගලයන් අතර බෙදා හදා ගැනීම, කරුණාව දයාව දැක්වීම, සහයෝගිතාව වර්ධනය කිරීම, ප්‍රජාවට සත්කාර කිරීම ආදිය කෙරෙහි ආරියරත්න මහතා දැඩි උනන්දුවක් දැක්වී ය. ගාන්ධි සාම ත්‍යාගයෙන් පිදුම් ලැබූ ඔහු ශ්‍රී ලංකාවට ද මහත් කීර්තියක් ගෙන දීමට සමත් විය.



## වික්ටර් හෙට්ටිගොඩ

ආයුර්වේද හා ඖෂධීය නිෂ්පාදන පිළිබඳ ව පුරෝගාමියකු වන ඔහු ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධියට පත් ව ඇත්තේ 'සිද්ධාලේප වෙද මහතා' වශයෙනි. බාම්, තෙල්, දත් බෙහෙත් ආදී නිෂ්පාදනවලින් කුඩාවට ආරම්භ කළ ඔහුගේ ව්‍යාපාරය, 'සිද්ධාලේප' සන්නාමය යටතේ මහත් ප්‍රසිද්ධියට පත් ව ඇත. කැපවීම, දැඩි අධිෂ්ඨානය, නිෂ්පාදනවල ගුණාත්මක බව හා විශ්වාසනීයත්වය ඔහුගේ සාර්ථකත්වයට හේතු වී ඇත.

## අචලා සමරදිවාකර



විශාල වෙළෙඳපොළක් සොයා ගත නොහැකි ගැටලුවකට ග්‍රාමීය නිෂ්පාදකයින් මුහුණ පා සිටින බව ඇයට නිරීක්ෂණය විය. එම ගැටලුවට විසඳුමක් ලබා දීමේ අරමුණින් බත්තරමුල්ල දියත උයනේ කඩ කාමර විශාල ප්‍රමාණයක් වෙන් කර ග්‍රාමීය වශයෙන් සිටින කෘෂිකාර්මික හා ගෘහ ආශ්‍රිත නිෂ්පාදකයන්ට භාණ්ඩ අලෙවි කිරීමට ඇය විසින් අවස්ථාව සලසා දෙන ලදි. කොළඹ නගරය ආශ්‍රිත ව 'ගුඩ් මාර්කට්' (Good Market) නමින් සුපිරි වෙළෙඳපොළක් ආරම්භ කර ග්‍රාමීය නිෂ්පාදන කොළඹ සිටින ඉහළ ආදායම් ලබන පුද්ගලයන්ට අලෙවි කිරීමට අවස්ථාව උදා කර දීම ද ඇය විසින් සිදු කරන ලදි. එමෙන්ම කාබනික නිෂ්පාදන සිදු කරන ග්‍රාමීය නිෂ්පාදකයන්ට ඒවා විදේශ වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමට අවශ්‍ය තත්ත්ව සහතික අඩු පිරිවැයකින් ලබා දෙන ක්‍රමවේදයක් ද ඇය විසින් හඳුන්වා දෙන ලදි. මේ ආකාරයට ග්‍රාමීය වශයෙන් සිටින කෘෂිකාර්මික හා ගෘහ ආශ්‍රිත නිෂ්පාදන කරන සුළු පරිමාණ නිෂ්පාදකයින්ට දේශීය සහ විදේශීය වෙළෙඳපොළට ප්‍රවේශ වීමට දායකත්වය ලබා දෙන ලදි.




## බිල් ගේට්ස්

මයික්‍රොසොෆ්ට් සමාගමේ නිර්මාතෘවරයා මොහු වේ. ඔහුගේ අපේක්ෂාව වූයේ තාක්ෂණය භාවිත කරමින් පාසල්, කාර්යාල හා නිවෙස් ආදියෙහි වැඩ කටයුතු පහසු කර ගැනීමට සැලැස්වීම ය. තව ද ඔහු වර්තමානයේ 'බිල් සහ මෙලින්ඩා ගේට්ස් පදනම' පිහිටුවා අධ්‍යාපනය හා සෞඛ්‍යය යන අංශවල උන්නතිය වෙනුවෙන් දානපතියෙකු ලෙස කටයුතු කරන්නේ ය. ඔහු අපිට කියා දෙන පාඩම වන්නේ උසස් අදහස්වලින් හා කරුණාවන්ත වීමෙන් ලෝකය වෙනස් කළ හැකි බව යි.

## ස්ටීව් ජොබ්ස්



ඇපල් සමාගමේ නිර්මාතෘවරයා ය. ඔහු iphone, ipad, ස්මාර්ට් දුරකථන වැනි නව නිපැයුම් ගණනාවක විප්ලවීය තාක්ෂණික වෙනසක් ඇති කිරීමට සමත් විය. ආරම්භක අවස්ථාවේ අභියෝග පැමිණියත් නිර්මාණශීලීත්වය හා නොපසුබට උත්සාහය තුළින් සාර්ථකත්වයට පත් විය හැකි බව ඔහු පෙන්වා දුන්නේ ය. එමෙන්ම වෙනස් ව සිතීම හා සරල නමුත් හොඳින් ක්‍රියා කරන නිමැවුම් බිහි කිරීම කෙරෙහි ඔහු දැඩි ව විශ්වාසය තැබී ය. සිහින සැබෑ කර ගැනීමට නම් කැප වී වැඩ කිරීමට සිදු වන බව ඔහුගෙන් අපට ඉගෙන ගැනීමට ඇති පාඩම වේ.




## ඊලෝන් මස්ක්

මොහු ප්‍රසිද්ධියක් උසුලන්නේ විදුලි මෝටර් රථ හා රොකට් නිෂ්පාදනය කරන බොහෝ දුර දක්නා ව්‍යවසායකයකු වශයෙනි. ඔහුගේ සිහිනය වන්නේ පිරිසිදු පොළොවක් ඇති කිරීමත්, මිනිසුන් ග්‍රහලෝකවල ජීවත් කර වීමත් ය. තව ද විද්‍යාත්මක දැනුම මගින් බොහෝ ගෝලීය ගැටලු විසඳා ගත හැකි බවත්, තාරකා ගවේෂණය කළ හැකි බවත් ඔහු පෙන්වා දෙයි. වටිනා අදහස් තිබීමත්, වෙහෙස ගැන නොසලකා කැප වී වැඩ කිරීමත් මගින් බොහෝ අභියෝග ජයගත හැකි බව ඔහුගෙන් අපට ඉගෙන ගත හැකි පාඩම් වේ.



## රතන් ටාටා

ඉන්දියානු ජාතික මොහු 'ටාටා' සමූහ ව්‍යාපාරයේ සභාපතිවරයා විය. ඔහුගේ සමූහ ව්‍යාපාරයට විවිධ වර්ගයේ වාහන නිපදවීම, යකඩ, තේ හා තාක්ෂණික උපකරණ නිෂ්පාදනය ආදිය ඇතුළත් විය. ඔහුගේ නිෂ්පාදනයක් වන 'ටාටා නැනෝ' මෝටර් රථය ඇතුළු විවිධ වර්ගයේ ටාටා රථ වාහන ලංකාවේ ද සුලබ ව දක්නට ලැබේ. රතන් ටාටා සෞඛ්‍යයට, අධ්‍යාපනයට, දුප්පත් ගොවියන්ට, තරුණ ව්‍යවසායකයන්ට ධනයෙන් ද උපකාර කරනු ලැබී ය. ඔහු පෙන්වා දුන්නේ මහන්සි වී වැඩ කිරීම, අවංක වීම, සමාජ සත්කාරය ආදිය ව්‍යාපාරයක සාර්ථකත්වයට හේතු වන බව යි.

## මාර්ක් සකර්බර්ග්

'මුහුණු පොත' ඔස්සේ සමාජ මාධ්‍ය ක්ෂේත්‍රයේ පෙරළියක් කළ පුරෝගාමියකු ලෙස මොහු ප්‍රසිද්ධියට පත් විය. මිනිසුන්ට අන්තර්ජාලය ඔස්සේ සම්බන්ධතා පැවැත්විය හැකි යෙදවුමක් (app) නිපදවීමට සමත් වූයේ ඔහුගේ වයස අවුරුදු 19 දී ය. ඔහුගේ මෙම උත්සාහය තුළින් මිනිසුන් හා පවුල් ගෝලීය වශයෙන් දුරස් ව සිටියත්, සමීප ව ඇසුරු කිරීම සඳහා අවකාශයක් සලසා දී ඇත. නිර්මාණශීලී අදහස් මගින් ලොව වෙනස් කළ පුද්ගලයකුට ඔහු කදිම නිදසුනකි.



## පියවර 2.2

- මේ වන විට ඔබ ව්‍යවසායකයන්ගේ සිහින පිළිබඳ ව කිසියම් අවබෝධයක් ලබා ගෙන ඇත. තව ද ඔවුන්ගේ එම සිහින අදහසක් බවට ද, පසුව එය සැබෑ ක්‍රියාවක් බවට ද පත් කර ගෙන ඇති බව ඔබට අවබෝධ වන්නට ඇත. නිදසුනක් ලෙස රයිට් සහෝදරයෝ ඔවුන්ගේ සිහිනය සැබෑ කරගත් ආකාරය පිළිබඳ සිතා බලන්න. සිහින සැබෑ කර ගැනීමෙන් අදාළ පුද්ගලයාට මෙන් ම ඔහුගේ පවුලට ද, රටට ද බොහෝ ප්‍රයෝජන අත්පත් කරගත හැකි ය.
- ඔබත් මේ වන විට, අනාගතයේ, නිරත වීමට අපේක්ෂා කරන ක්ෂේත්‍ර ප්‍රමුඛතාව අනුව හඳුනා ගෙන ඇත. එහි එක් ක්ෂේත්‍රයක් හෝ ක්ෂේත්‍ර කිහිපයක් පදනම් කරගෙන ඔබට අනාගතයේ ඉටුකර ගත හැකි සිහිනයක් ගොඩනඟා ගන්න.
- අනතුරුව ඔබගේ සිහිනය පිළිබඳ ව තොරතුරු පහත සඳහන් උපදෙස් අනුව සිදුකර ගුරුවරයාට ඉදිරිපත් කිරීමට කටයුතු කරන්න.

**උපදෙස්:**

**A** ඔබගේ සිහිනය අදහසක් ලෙස සරල ව ප්‍රකාශ කිරීමට උත්සාහ ගන්න.

**B** ඊළඟට එම අදහස ඔබේ ම වචනයෙන් ලියන්න.

**C** එම සිහිනය ඔබට ද, ඔබේ පවුලට හා රටට ද ප්‍රයෝජනවත් වන අයුරු සිතා බලන්න.

**D** එයින් එක් එක් පාර්ශ්වයන්ට ලැබෙන ප්‍රයෝජන සඳහන් කරන්න.

පහත දැක්වෙන ආකාරයේ වගුවක් යටතේ ඉහත ඔබ කළ කාර්යයට අදාළ තොරතුරු සටහන් කරන්න.

| මගේ සිහිනය: ............ | | |
|---|---|---|
| මගේ සිහිනය මට ප්‍රයෝජනවත් වන ආකාරය | මගේ සිහිනය මගේ පවුලට ප්‍රයෝජනවත් වන ආකාරය | මගේ සිහිනය රටට ප්‍රයෝජනවත් වන ආකාරය |
| | | |

## පියවර 2.3

ඔබට මෙන් ම අන් අයට ද සිහින තිබේ. ඒ පිළිබඳ සොයා බැලීම සඳහා මෙම පියවරේ දී උත්සාහ ගනිමු. ඒ සඳහා පහත සඳහන් පාර්ශ්ව ඇතුළත් වන පරිදි පුද්ගලයන් **දෙදෙනෙකු** තෝරා ගන්න.

1. ස්වකීය පන්තියේ මිතුරෙක් / මිතුරියක්
2. පාසලේ වෙනත් පන්තියක මිතුරෙක් / මිතුරියක්
3. පවුලේ සමාජිකයෙක් හෝ ඥාතියෙක්

**ඔවුන් මුණ ගැසී පහත සඳහන් තොරතුරු විමසා දැනගන්න.**

**A** අනාගත සිහිනය

**B** එවැනි සිහිනයක් ඇති කර ගැනීමට හේතුව

**C** එම සිහිනය සැබෑ කර ගැනීමෙන් ඔහුට ලැබෙන ප්‍රයෝජන

**D** එම සිහිනය සැබෑ කර ගැනීමෙන් රටට ලැබෙන ප්‍රයෝජන

ඔබ පුද්ගලයන් දෙදෙනකුගෙන් ලබා ගත් තොරතුරු පහත දැක්වෙන ආකාරයේ වගුවක ඇතුළත් කරන්න.

| තොරතුරු ලබාගත් මිතුරා / මිතුරියගේ නම හෝ ඥාතියෙකු නම් ඥාතිකම | ඔහුගේ / ඇයගේ සිහිනය **A** | සිහිනය ඇති කර ගැනීමට හේතුව **B** | සිහිනය සැබෑ කර ගැනීමෙන් ඔහුට / ඇයට ලැබෙන ප්‍රයෝජන **C** | සිහිනය සැබෑ කර ගැනීමෙන් රටට ලැබෙන ප්‍රයෝජන **D** |
|---|---|---|---|---|
| 1. | | | | |
| 2. | | | | |

**පියවර 2.3 යටතේ ඔබ කළ කාර්යයේ සාර්ථකත්වයේ ප්‍රමාණය මැනිය හැකි අයුරු දැක්වෙන වගුව**

| නිර්ණායක | කාර්ය සාධනය මැනෙන කුසලතා මට්ටම් | | | ලැබූ ලකුණු |
|---|---|---|---|---|
| | ඉතා හොඳයි (ලකුණු 10-08) | හොඳයි (ලකුණු 07-04) | සංවර්ධනය විය යුතුයි (ලකුණු 03-01) | |
| 1. පුද්ගලයන් දකින සිහින සහ ඒවා ඇති කර ගැනීමට හේතුව ඉදිරිපත් කරයි. | දෙදෙනෙකුගේ සිහින පැහැදිලි ව ලියා එම සිහින ඇති කර ගැනීමට හේතුව එක් එක් පාර්ශ්ව අනුව දැක්වීම | එක් පාර්ශ්වයකගේ සිහිනය සහ එම සිහිනය ඇති කර ගැනීමට හේතුව දැක්වීම | සිහිනය සහ සිහිනය ඇති කර ගැනීමට හේතු අඩුපාඩු සහිත ව දැක්වීම | ---/10 |
| 2. යම් සිහිනයක් සැබෑ කර ගැනීමෙන් සිහිනය දකින පුද්ගලයාට සහ රටට ලැබෙන ප්‍රතිලාභ පෙන්වා දෙයි. | පුද්ගලයාට සහ රටට ලැබෙන ප්‍රතිලාභ වෙන වෙන ම දැක්වීම | එක් පාර්ශ්වයකට අදාළ ව එම පුද්ගලයාට සහ රටට ලැබෙන ප්‍රතිලාභ දැක්වීම | ලැබෙන ප්‍රතිලාභ අඩුපාඩු සහිත ව දක්වා තිබීම | ---/10 |
| මුළු ලකුණු | | | | ---/20 |

ඔබ හිමි කර ගත් සමස්ත ලකුණු මත ඔබගේ සාර්ථකත්වයේ ප්‍රමාණය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි ආකාරය මෙසේ ය.

| ලකුණු | 15 - 20 | 09 - 14 | 8 හෝ ඊට අඩු |
|---|---|---|---|
| ඔබගේ සාර්ථකත්වය | විශිෂ්ටයි | මධ්‍යස්ථයි | සංවර්ධනය විය යුතුයි |



## ක්‍රියාකාරකම 03



# ගැටලු හඳුනා ගෙන විසඳමු

**මෙම ක්‍රියාකාරකමෙහි නිරත වීමෙන් ඔබට,**

- සමාජයේ පුද්ගලයන් මුහුණ දෙන ගැටලු හඳුනා ගැනීමට
- ගැටලුවක් සඳහා සුදුසු විසඳුමක් යෝජනා කිරීමට
- ගැටලුවක් විසඳීම සඳහා ගත හැකි සුදුසු ක්‍රියාමාර්ගයක් තීරණය කිරීමට

**හැකි වේ.**

## ක්‍රියාකාරකම 3
### ගැටලු හඳුනා ගැනීම හා විසඳුම් යෝජනා කිරීම.

**පාසල් සිසුවකු වන 'රවී'ගේ කතාව කෙරෙහි අවධානය යොමු කරන්න.**

සාර්ථක ව්‍යාපාරිකයන් මෙන් ම නව නිෂ්පාදන ද බිහි වී ඇත්තේ මිනිසුන් මුහුණ දෙන ගැටලුවලට විසඳුම් වශයෙන් භාණ්ඩ හෝ සේවා ඉදිරිපත් කිරීමෙන් ය. එහි දී මිනිසුන් මුහුණ දෙන ගැටලු හඳුනා ගැනීමත්, ඒවාට නිර්මාණාත්මක විසඳුම් සිතා බැලීමත් වැදගත් වේ.

ශ්‍රී ලංකාව ස්වාභාවික සම්පත් බහුල රටක් වේ. එමෙන්ම කෘෂිකාර්මික බෝගවලටත් ප්‍රසිද්ධියක් උසුලයි. ඒ අතුරින් කෘෂි භෝගයක් වූ කුරුඳු භාවිත කරමින් ටොෆි නිපදවීමට 'රවී' නමැති යොවුන් ව්‍යවසායකයා සමත් වී ඇත.



රවීගේ පවුලේ ප්‍රධාන ජීවනෝපාය වූයේ කුරුඳු, ගම්මිරිස්, එනසාල් වැනි කුළුබඩු වර්ග පැකට් කර සංචාරකයින්ට අලෙවි කිරීම ය. රවී කල්පනා කරන්නට වූයේ ශ්‍රී ලංකාව ස්වාභාවික කුළුබඩු වර්ගවලට ප්‍රසිද්ධ රටක් වුවත් ඔවුන් කුළුබඩු වර්ග සංචාරකයින්ට අලෙවි කරන්නේ පැකට් කොට පවත්නා තත්ත්වයෙන් වීම ගැන ය.

මේ වනවිටත් විවිධ ව්‍යවසායකයන්ගේ කතා පුවත් අධ්‍යයනය කර තිබූ රවීට පෙනී ගියේ ඔවුන්ගේ සිහින අදහස් බවට ද පසුව නව නිෂ්පාදන බවට පරිවර්තනය කර ගෙන ඇති බව යි. ඒ අනුව එක් දිනක් රවීට හොඳ අදහසක් පහළ විය.

තම කුළුබඩුවලින් අලුත් දෙයක් නිපදවිය හැකි නම් එයින් විශාල වාසියක් අත් කර ගත හැකි බව ඔහුට වැටහුණි. ඒ අනුව කල්පනා කළ ඔහු කුරුඳු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන්නට විය.

**රවීගේ අදහස සාර්ථක ව ක්‍රියාත්මක කිරීම සඳහා ඔහු අනුගමනය කළ ක්‍රමවේදය පහත දැක්වේ.**

## 1 ගැටලුව හඳුනා ගැනීම

- සංචාරකයෝ ශ්‍රී ලංකාවේ ස්වාභාවික කුළුබඩු අතරින් කුරුඳුවලට බෙහෙවින් ඇලුම් කරති. නමුත් කුරුඳු භාවිත කොට සිදු කරන නිෂ්පාදන විරල ය.
- සංචාරකයින් බොහෝ දෙනෙකු ශ්‍රී ලංකාවේ ස්වාභාවික ඖෂධීය ගුණ ඇති ආහාර රස විඳීමට රුචිකත්වයක් දක්වන අතර, ස්වාභාවික ඖෂධීය අමුද්‍රව්‍යවලින් නිපදවන ටොෆි ගැන අසන්නට හෝ දකින්නට ලැබීම විරල ය.

## 2 ගැටලුව සඳහා විසඳුම් හා ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග

**විසඳුම:**

- ස්වාභාවික පැණි සහ කුරුඳු මිශ්‍රිත ව ඖෂධීය ටොෆියක් නිපදවීම

**ක්‍රියාමාර්ග:**

- ටොෆි නිපදවීම සඳහා අවශ්‍ය තොරතුරු අන්තර්ජාලයෙන් සොයා බැලීම
- පවුලේ සාමාජිකයන්ගෙන් හා වෙනත් බාහිර අයගෙන් අවශ්‍ය උපදෙස් හා උදවු උපකාර ලබා ගැනීම
- ටොෆි නිපදවීම සහ ගුණාත්මක බව පරීක්ෂා කිරීම
- නිපදවන ටොෆි ප්‍රදේශයට පැමිණෙන සංචාරකයන්ට අලෙවි කිරීම

## පියවර 3.1

'රවී' ව්‍යාපාර කාර්යයට පිවිසි ආකාරය පිළිබඳ ව ඔබ අවබෝධයක් ලබා ගන්නට ඇත. ඔබත් පරිසරයේ හෝ සමාජයේ පවත්නා ගැටලුවක් කෙරෙහි අවධානය යොමු කරන්න. ඒ සඳහා සුදුසු විසඳුමක් යෝජනා කිරීමට උනන්දු වන්න. ඒ සඳහා පහත සඳහන් උපදෙස් පිළිපදින්න.

**A** හඳුනා ගත් ගැටලුව කුමක් දැයි සරල ව ලියන්න.

**B** ගැටලුවට හොඳ ම විසඳුමක් සිතා එය යෝජනා කරන්න. එම විසඳුම භාණ්ඩයක්, උපකරණයක්, ක්‍රියාකාරකමක් හෝ අදහසක් විය හැකි ය.

**C** විසඳුම ලබා දීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ගය ලියා දක්වන්න.

**D** මේ සඳහා පහත දැක්වෙන ආකාරයේ වගුවක් භාවිත කළ හැකි ය.

| | |
|---|---|
| ගැටලුව: | |
| ගැටලුව සඳහා යෝජනා කරන විසඳුම | |
| විසඳුම ලබා ගැනීම සඳහා යෝජනා කරන ක්‍රියාමාර්ගය | |

කාර්යය නිම කිරීමෙන් අනතුරුව එය සමස්ත පන්තියට නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමට සූදානම් කර ගන්න.



**පියවර 3.1 යටතේ ඔබ කළ කාර්යයේ සාර්ථකත්වයේ ප්‍රමාණය මැනිය හැකි අයුරු දැක්වෙන වගුව**

| නිර්ණායක | කාර්ය සාධනය මැනෙන කුසලතා මට්ටම් | | | ලැබූ ලකුණු |
|---|---|---|---|---|
| | ඉතා හොඳයි (ලකුණු 10-08) | හොඳයි (ලකුණු 07-04) | සංවර්ධනය විය යුතුයි (ලකුණු 03-01) | |
| 1. හඳුනා ගත් ගැටලුවක් සඳහා උචිත විසඳුමක් යෝජනා කරයි. | පවත්නා ගැටලුවක්, හඳුනා ගැනීම<br>ගැටලුවට පිළියම් වන විසඳුමක් දීම, එම විසඳුම සිසුවාගේ අදහසක් වශයෙන් සරල ව තාර්කික ව පෙන්වා දීම | පවත්නා ගැටලුවක් හඳුනා ගැනීම<br>ගැටලුවට පිළියම් වන විසඳුමක් දීම, එම විසඳුම සිසුවාගේ අදහසක් වශයෙන් පෙන්වා දීම | පවත්නා ගැටලුවක් හඳුනා ගැනීම<br>එයට උචිත විසඳුමක් යෝජනා කිරීම දුර්වල මට්ටමක පැවතීම | ---/10 |
| 2. තොරතුරු සංවිධානාත්මකව පැහැදිලිව හා නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි. | ඉදිරිපත් කරන තොරතුරුවල සංවිධානාත්මක බව, නිර්මාණශීලී බව, පැහැදිලි බව හා පැහැදිලි ව සන්නිවේදනය කිරීම ඉහළ මට්ටමක පැවතීම | ඉදිරිපත් කරන තොරතුරුවල සංවිධානාත්මක බව, නිර්මාණශීලී බව, පැහැදිලි බව හා පැහැදිලි ව සන්නිවේදනය කිරීම සතුටුදායක මට්ටමක පැවතීම | ඉදිරිපත් කරන තොරතුරුවල සංවිධානාත්මක බව, නිර්මාණශීලී බව, පැහැදිලි බව හා පැහැදිලි ව සන්නිවේදනය කිරීම දුර්වල මට්ටමක පැවතීම | ---/10 |
| මුළු ලකුණු | | | | ---/20 |

ඔබ හිමි කර ගත් සමස්ත ලකුණු මත ඔබගේ සාර්ථකත්වයේ ප්‍රමාණය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි ආකාරය මෙසේ ය.

| ලකුණු | 15 - 20 | 14 - 09 | 08 හෝ ඊට අඩු |
|---|---|---|---|
| ඔබගේ සාර්ථකත්වය | විශිෂ්ටයි | මධ්‍යස්ථයි | සංවර්ධනය විය යුතුයි |

- **සමස්ත මොඩියුලය ඇසුරින් ඔබ ඉගෙන ගත් දෑ පිළිබඳ ව ගුරුවරයා ලබා දෙන ඇගයීමට සාර්ථක ව මුහුණ දීමට සූදානම් වී සිටින්න.**

මෙම මොඩියුලය මගින් ඔබට ලකුණු උපයා ගත හැකි ආකාරය පෙන්නුම් කරන සටහන.

| අංකය | නිර්ණායක | පිරිනැමෙන ලකුණු |
|---|---|---|
| 1 | ස්වයං තක්සේරුව | |
| | රූබ්‍රික් (Rubrics)<br>1. ක්‍රියාකාරකම 01<br>2. ක්‍රියාකාරකම 02<br>3. ක්‍රියාකාරකම 03<br>එක් ක්‍රියාකාරකමකට ලකුණු 20 බැගින් (20×3) | 60 |
| 2 | ■ මොඩියුලය පිරිසිදු ව භාවිත කිරීම | 05 |
| 3 | ■ සිසුන් සමග කණ්ඩායමක් ලෙස සහයෝගයෙන් කටයුතු කිරීම | 05 |
| 4 | සම්පිණ්ඩිත ඇගයීම (Summative Assessment)<br>සමස්ත මොඩියුලය අධ්‍යයනය කිරීමෙන් පසු ඇගයීම | 30 |
| | මුළු ලකුණු | 100 |

උපයා ගන්නා ලකුණු පදනම් කර ගෙන ඔබගේ සාර්ථකත්වයේ ප්‍රමාණය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි ය.

| මුළු ලකුණු | කාර්ය සාධන මට්ටම |
|---|---|
| 91 - 100 | අති විශිෂ්ටයි |
| 81 - 90 | විශිෂ්ටයි |
| 61 - 80 | හොඳයි |
| 41 - 60 | මධ්‍යස්ථයි |
| 40 ට අඩු | සංවර්ධනය විය යුතුයි |